

# විදේශ රැකියා සඳහා වෘත්තීය පුහුණුලාභීන් දිරිමත් කිරීම

වෘත්තීය පුහුණුලාභීන් විදේශ රැකියා සඳහා යොමුවීම දිරිමත් කිරීමේ අරමුණින් විදේශ රැකියා සඳහා යොමුවන වෘත්තීය පුහුණුලාභීන්ගේ පාඨමාලා ගාස්තු සහ විභාග ගාස්තු කොන්දේසිවලට යටත්ව ප්‍රතිපූරණය කිරීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තිරණය කර ඇත.

1. සුදුසුකම් ලබන පුහුණුලාභීන් හෝ රැකියාලාභින්
   - i. ජපානයේ රැකියාවලට යන විශේෂ නිපුණතා සහිත සේවකයින් (Specified Skilled Workers - SSW)
   - ii. ජපන් ප්‍රවීණතා විභාග සමත්ව සීමාවාසී තාක්ෂණික පුහුණුලාභීයෙකු ලෙස හෝ ජපානයේ රැකියාවක් සඳහා යොමුවන තරුණ තරුණියන්
   - iii. පහත සඳහන් රැකියා ක්ෂේත්‍රයන්හි වෘත්තීය පුහුණුව ලබා විදේශ රැකියා සඳහා යොමුවන අයවලුන්.
     - ආගන්තුක සත්කාරක ක්ෂේත්‍රය
     - මුල්‍ය හා අලෙවිකරණ ක්ෂේත්‍රය
     - කාර්මික ශිල්පීන් ක්ෂේත්‍රය
     - තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය
     - ඉදිකිරීම් ක්ෂේත්‍රය
     - සාත්තු සේවක ක්ෂේත්‍රය

2. අයදුම්කිරීමේ ක්‍රමවේදය හා ඉදිරිපත් කළ යුතු ලේඛන

   එතෙර රැකියාවක් සඳහා ශ්‍රමිකයෙකු/පුහුණුවන්නකු වශයෙන් යොමුවීමට කාර්යාංශයේ ලියාපදිංචිය ලබාගත් පසු, පහත සඳහන් ලියකියවිලි/තොරතුරු සමඟ සභාපති, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත ලිඛිත ඉල්ලීමක් කළ යුතුය.

   - නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (**www.slbfe.lk** වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය.)
   - පාඨමාලා ගාස්තු හෝ විභාග ගාස්තු ගෙවූ බවට අදාළ බිල්පත්වල මුල් පිටපත් හෝ අදාළ ආයතනයෙන් සහතික කළ පිටපත්.
   - විභාග සමත් වූ සහතිකවල පිටපත් (මෙය සාමදාන විනිශ්චයකාරවරයකු සහතික කළ යුතුය.) හා
   - මුදල් ප්‍රතිපූරණය කිරීම සඳහා අයදුම්කරුගේ බැංකු ගිණුමේ විස්තර සහිත පැහැදිලි ඡායා පිටපතක් සමගින් කළමනාකරු (පුහුණු - කර්මාන්ත හා ආයතනික, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, කම්කරු මහලේකම් කාර්යාලය, 28 මහළ, මෙහෙවර පියස, නාරාහේන්පිට) යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

3. ප්‍රතිපූරණය කරනු ලබන මුදල

   වෘත්තීය පුහුණුව සහ විභාග ගාස්තු සඳහා දරන ලද සත්‍ය වියදමෙන් 75% කට සමාන මුදලක් හෝ රු.100,000/- (රුපියල් ලක්ෂයක්) යන අගයන්ගෙන් අඩු අගය මේ යටතේ ප්‍රතිපූරණය කරනු ඇත.

   ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් වෙන්කර ඇති මුදල් ප්‍රමාණය මත ප්‍රතිපූරණය කරනු ලබන පුහුණුලාභීන්/ රැකියාලාභීන් සංඛ්‍යාව තීරණය වනු ඇත.


සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
අංක - 234,ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල
දුරකථන අංකය 0112 366 701


**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

ICT/F(S)/25

**සභාපති, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**

**විදේශ රැකියා සඳහා යොමුවන වෘත්තීය පුහුණුලාභීන්/රැකියාලාභීන් දිරිමත් කිරීම සඳහා, ඔවුන් විසින් දරන ලද පාඨමාලා ගාස්තු සහ විභාග ගාස්තු ප්‍රතිපූර්ණය කිරීමට අදාල ඉල්ලුම් පත්‍රය.**

**පෞද්ගලික තොරතුරු**

1. සම්පූර්ණ නම : ..........................................................................................................
2. ලිපිනය : ..........................................................................................................
3. විද්‍යුත් ලිපිනය : ..........................................................................................................
4. දුරකතන අංකය :..........................................................................................................
5. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා ඇති ගමන් බලපත්‍ර අංකය :...............................
6. විදේශ රැකියාව/පුහුණුව සඳහා යාමට අපේක්ෂිත රට :...............................

**වෘත්තීය පුහුණුව/රැකියාව පිළිබඳ තොරතුරු**

| ජපන් රාජ්‍යයේ පුහුණුව/ රැකියාව සඳහා යොමුවූවන් | | වෘත්තීය රැකියා සඳහා ජපානය හැර අනෙකුත් රටවල යොමුවන අයවූවන් | |
|---|---|---|---|
| රැකියා ක්ෂේත්‍රය | වැය වූ මුදල(රු) | පහත රැකියා ක්ෂේත්‍රය සඳහා සමත් වූ විභාග | වැය වූ මුදල(රු) |
| සීමාවාසික තාක්ෂණික පුහුණුලාභීන්(TITP) සමත් විභාග මට්ටම | | ආගන්තුක සත්කාර | |
| | | මූල්‍ය හා අලෙවිකරණ | |
| | | කාර්මික ශිල්පීය | |
| විශේෂ නිපුණතා සහිත සේවකයින් | | සාත්තු සේවය | |
| | | තොරතුරු තාක්ෂණ | |
| | | ඉදිකිරීම් | |

අයදුම්කරුගේ අත්සන :-............................................ දිනය :-..................................

..........................................................................................................................................

**අයදුම්පත සමග පහත සඳහන් ලිපි ලේඛන අනිවාර්යෙන්ම ඉදිරිපත් කළ යුතුය.**

1. සමත් වී ඇති විභාග සහතිකපත්, සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.
2. විභාග ගාස්තු හා පාඨමාලා ගාස්තු සඳහා ගෙවන ලද මුදල් වලට අදාළ බිල්පත් වල මුල් පිටපත් ඉදිරිපත් කල යුතුය.
3. අයදුම්කරුගේ බැංකු ගිණුමේ විස්තර සඳහන් පිටුවේ පැහැදිලි පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

| | | |
|---|---|---|
| Reviewed by : | Manager | |
| Approved by : | Deputy General Manager | |